# ඕස්ට්‍රේලියාවේ වේදිකා නාට්‍යය 3

ආචාර්ය
තරංග චින්තන
දන්දෙනිය



(පෙර කලාපයෙන්)

1901 දී ප්‍රාන්ත එක්වී ෆෙඩරේෂණයක් බවට පත්වීමෙන් පසුව ඒකාබද්ධ නව ඕස්ට්‍රේලියාවේ ජාතික අනන්‍යතාව පිළිබඳ හැඟීම ජනතාව ට හැඟුණි. ජනපදවාසි ඕස්ට්‍රලියානු ජන ජීවිතය සහ අත්දැකීම් හි සුවිශේෂිතාව ක්‍රමයෙන් ජාතික අනන්‍යතාව ලෙස ජනතාව පිළිගත් අතර, එම ප්‍රස්තුතයන් කලාකරුවන්ගේ නිර්මාණ සඳහා උත්තේජන බවට පත්විය. චිත්‍ර කලාවේ කාලාන්තරයක් තිස්සේ මෙකී ප්‍රස්තුත ප්‍රතිනිර්මාණය වූ අතර, එය අනතුරුව එය සාහිත්‍ය කලාවට ද, පසුකාලීනව රංග කලාවට සහ සිනමා කලාවට ද අනුවර්තනය කරගන්නා ලදී.

1895 දී ලුමියර් සහෝදරයෝ චලන චිත්‍රය ලොවට හඳුන්වා දුන් පසු ලෝකයේ බිහිවූ පළමු දීර්ඝ වෘතාන්ත චිත්‍රපටය බිහිවන්නේ මෙල්බර්න් ආශ්‍රිතව 1906 දී ය. එම සිනමා වෘතාන්තය පාදක කරගන්නේ, 1870 දශකයේ අග අපරාධකරුවන් යැයි කුප්‍රකටව සිටි (පසුව එල්ලා මරණ ලද) වික්ටෝරියා ප්‍රාන්තයේ විසූ නීතියෙන් පිටිවලුන් වූ නෙඩ් කැලී සහ කල්ලිය පිළිබඳ කතා පුවතකි. මේ අභාසය මත සමකාලීන නාට්‍ය කලාව විසින් ද ජනපද ප්‍රත්‍යන්තයන්හි වගා කරුවන්, සත්ව පාලකයන්, සහ ලඳු කැළෑ බඳව සැඟවී සිටිනා හෝ සැරිසරන හෝ නීතියෙන් පිටිවලුන්ගේ ද ජීවිත ප්‍රස්තුතයන් ප්‍රතිනිර්මාණය කරන ලදී.

1907 දී Bert Bailey සහ Edmund Duggan රචකයින් විසින් Albert Edmunds යන සාහිත්‍ය නාමය යටතේ නිර්මාණය කරන ලද The Squatter's Daughter or, The Land of the Wattle වේදිකා රංගය මේ අතර ප්‍රධාන ස්ථානයක් හිමිකරගනු ලැබුනි. මෙය බැටළු ගොවිපලවල් දෙකක් හා සබැදි සිදුවීම් ප්‍රතිනිරූපනයකි. මෙලෝඩ්‍රාමා වර්ගයේ මේ වේදිකා රංගය ඕස්ට්‍රේලියානු ලඳු කැළෑ බඳ තත්ත්වය තථ්‍ය ලෙස ප්‍රතිනිර්මාණය කිරීමට කළ ස්වභාවික වාදී රංග කලා වැයමකි. වේදිකාවේ තිරය ඇරෙනවිට දිවයන සජීවී බැටළුවන් ද, බුරමින් යන බැටළු පාලක සුනඛයෙක් ද, ලඳු කැළෑ ද, දරපැලීම් ද, කස පිපිරීම් ද, බැටළුවන් ගේ ලොම් කැපීමේ තරගයක් ද, ගැලුන් පන්සීයක් පමණ සැබෑ ජලය ඇදහැළෙන දියඇල්ලක් ද, සිනාසෙන කොකබුරා පක්ෂියෙක් ද (සම පිරවූ), මිනිසෙක් සමග සටන් කරනා කැන්ගරුවෙක් ද (සම පිරවූ කැන්ගරුවෙක් යැයි සිතමි) ආදී අංග මෙහි ඇතුළත් විය. මට හැගෙන ආකාරයට, එක අතකින්, වේදිකාවේ වූ මෙම තථ්‍ය ප්‍රතිනිර්මාණ වෑයම වූ කලී තම වේදිකා සීමාවන් අතික්‍රමණය කිරීම සඳහාත් නව කතා රූපණ මාධ්‍යක් වූ සිනමාවේ තථ්‍ය ප්‍රතිනිර්මාණ සමග ප්‍රේක්ෂකයා දිනාගැනීමට ත් සිදු කරන්නට යෙදුණා වූ තරඟයකි. අනෙක් අතට, 1900 දී මෙල්බර්න් හි වේදිකා ගතකළ නෝර්වේජියානු ජාතික Henrik Ibsen ගේ Hedda Gabbler (1891) වැනි නට්‍ය මගින් හඳුනාගත් යුරෝපියානු යථාර්තවාදී රංග කලාවේ අභාසයකි. එසේ වුවත්, ඔපෙරා රංග හි විශේෂතා වූ සංගීතය සහ ගායනය ආදී අනුශාංගික අංග මගින් උද්දීපනය කරන චරිත සහ අවස්ථා, ස්වභාවික සහ යථාර්ථ වාදී ලක්ෂණ ද සහිතව, ඕස්ට්‍රේලියානු ප්‍රේක්ෂකයින් හට අවශ්‍ය වූ අධිරංගයක් මෙහි දී බිහිවී ඇත. මිලියන එකහමාරක් පමණක් පමණ ප්‍රේක්ෂකයන් නරඹනු ලැබූ ලැබූ මෙම වේදිකා රංගය ඉන් වසර තුනක් යනතෙක්ම ඕස්ට්‍රේලියාවේ ප්‍රාන්ත අතර ද නවසීලන්තයේ ද සංචාරය කරණ ලදුව, එවකට පවුම් 70000 ක ශුද්ධ ලාබයක් හිමිකරගන්නා ලදී. එය එවකට වඩාත්ම ප්‍රේක්ෂක අවදානයට ලක්වූ රංගයයි.

ඉහත සඳහන් රචකයන් විසින් වේදිකා ගතකළ The Man from Out Back; or, Stockwhip and Stirrup නාට්‍යද ඉහත කී වර්ගයේම වේදිකා රංගයකි. මෙහි දුෂ්ටයෝ වන්නේ හරක් හොරු ය. අස්සයෝ ද, බල්ලෝ ද, කොකොටුවෙක් ද වේදිකාවට නැංවූ මෙම රංගයේදී, සොරකම් කළාවූ එකී හරක් රැල වේදිකාවට ගෙන එන දර්ශනයක් පසුව ඉවත් කර ඇත්තේ, වේදිකා විනයක් නැති ඒ හරක් රැල රංග පුහුණු කාලයේ දී සිදුකළ පසුගාමී රංගනය නිසාය. ස්වභාවිකවාදී රංගයක් උදෙසා රචනා කළ Bert Bailey සහ Edmund Duggan ඕස්ට්‍රේලියානු රංග කලාවට වැදගත් වන්නේ, වේදිකා රචනය සඳහා ඔවුන් ඕස්ට්‍රේලියානු ජන අනන්‍යතාවකින් යුතු කතා තෝරා ගැනීම සහ එය නව ඕස්ට්‍රේලියානු ජාතික අනන්‍යතාවක් බිහිකිරීමට දායක කිරීම නිසාය.













ඕස්ට්‍රේලියානු රංග ඉතිහාසයේ කඩඉම් වේදිකා නාට්‍යයක් වූ On Our Selection වේදිකා අනුවර්තනය Steele Rudd's On Our Selection නම් කතා එකතුවෙන් අනුවර්තනය කරණ ලද්දකි. 1860 දශකයේදී හඳුන්වා දුන් ඉඩම් පිළිබඳ නීති මගින් ඉඩම් නිත්‍යානුකූල යෝජිතයන් (Selectors) අත්පත් කරගත් අතර, සහ එම නීති මගින් අත්පත්කර ගත් ඇතැම් ඉඩම් හි මුලින් පදිංචි කරුවන් හෝ පැවරුම් කරුවන් වූ එම යුගයේ පිටිවහලුන් සහ සංක්‍රමිනිකයන්ගෙන් සමග අලුතෙන් ඉඩම් අත්පත් කරගත්තන්ගේ ජීවන අරගලය මෙම කතා මාලාවට අයත් විය. එම කතා රඩ් ගේ පියාගේ

38 වන පිටට